## ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය - 2013

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උපවගන්තිය හා 108 සහ 111 වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ප්‍රමිතිවලට අනුකූලව කටයුතු නොකළ අවස්ථා පහත පරිදි නිරීක්ෂණය විය.

**(අ) ප්‍රමිති අංක 01**

සමුච්චිත අතිරික්තය හෝ ඌනතාවය සංචිතවලින් වෙන්කර දැක්විය යුතු වුවත්, එසේ වර්ගීකරණය කිරීමකින් තොරව ඉකුත් වර්ෂයෙන් ඉදිරියට ගෙනා පොදු සංචිත ගිණුමේ ආරම්භක ශේෂයට සමාලෝචිත වර්ෂයේ ඌනතාව ගලපා සමුච්චිත ඌනතාව ලෙස පෙන්වා තිබුණි.

**(ආ) ප්‍රමිති අංක 02**

සමාලෝචිත වර්ෂය තුළ මුදල් ගලායාම් සහ ගලාඒම් පිළිබිඹු වන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කළයුතු නමුත්, ඒ සම්බන්ධව පහත දුර්වලතා නිරීක්ෂණය විය.

(i) වර්ෂය තුළ කාරක ප්‍රාග්ධන සංචලනයේ ඇතුළත් තොගයේ රු.486,969 ක මුදල් ගලායාමක්, රු.11,639,385 ක ලෙස හා අනිකුත් ජංගම වත්කම්වල රු.3,126,106 ක මුදල් ගලාඒමක් රු.8,026,310 ක මුදල් ගලායාමක් ලෙස දක්වා තිබුණි.

(ii) අහුරාතබන අරමුදල් (Restricted funds) සම්බන්ධයෙන් මුදල් ගලාඒම් ගණනය කිරීමේදි එයට අදාළ ගැලපීම් සිදු නොකිරීම නිසා සත්‍ය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය රු.4,015,640 ක වෙනසක් පැවතුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට තොගය පොත් වටිනාකමට ගිණුම්ගතකර තිබුණු අතර, එදිනට වූ තොග සත්‍යාපන වාර්තා වටිනාකම හා පොත් අගය අතර රු. 1,383,912 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ශුද්ධ වටිනාකම රු.6,220,301ක් වූ ජල බවුසරයක් අනතුරකින් නැවත භාවිතයට ගත නොහැකි ලෙස හානියට පත්ව තිබූ අතර, ඒ සඳහා පූර්ණ හානි පදනම යටතේ රක්ෂණ හිමිකම් ඉල්ලුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට වත්කමේ ශුද්ධ අගය ජංගම නොවන වත්කමක් ලෙස දක්වා ඇතත් හානිය පිළිබඳ හෙළිදරව්කර කර නොතිබුණි. අනතුරට පත් වත්කම වෙනුවෙන් රු.5,850,000 ක වන්දියක් ලබාදීමට රක්ෂණ සමාගම එකඟවී ඇති බව 2014 මාර්තු මාසයේදී දක්වා තිබුණි.

(ඇ) ක්ෂය ඇගයීමට පාදක කරගත් ස්ථාවර වත්කම් වටිනාකම සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව එම ස්ථාවර වත්කම් වටිනාකම් අතර රු. 202,012,681 ක වෙනසක් පැවතුණි. එම නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා තිබුණු වර්ෂයේ ක්ෂය රු. 168,701,356 ක ප්‍රමාණයේ නිවැරදිභාවය ගැටළු සහගත විය.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පහත සඳහන් ගිණුම් විෂයයන් සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| (අ) 2003 වර්ෂයට පෙර සිට පැවැත එන ණයගැති ශේෂය | 105,525 | විස්තරාත්මක උපලේඛණ |
| (ආ) විවිධ අරමුදල් ශේෂ 32 ක් | 33,789,243 | විෂය ලිපිගොනු, අරමුදලේ පරමාර්ථ හා කාර්යයන් |

### 2.2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2011 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ සිට 2012 ඔක්තෝබර් මාසය දක්වා වූ කාලය සඳහා විශ්වවිද්‍යාලයට ආරක්ෂක සේවාවන් සපයා ගැනීම වෙනුවෙන් එළඹ තිබුණු ගිවිසුම පරිදි එකඟ වූ ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව සේවයේ නොයෙදීම නිසා අවශ්‍ය අඩු කිරීම් සිදු කොට ගෙවීම් කර තිබුණි. කෙසේ නමුත්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ලිඛිත ඉල්ලීම පරිදි අඩු කර ගත් රු. 9,432,774 ක මුදල ගිවිසුම්ගත කොන්දේසිවලට පටහැනිව ආපසු අදාළ ආරක්ෂක සමාගම වෙත ගෙවා තිබුණි.

### 2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ දී අය වීම් මුළුමනින්ම නතර වී තිබුණු එකතුව රු. 1,044,884 ක ලැබිය යුතු සේවක ණය ශේෂ 25 කින් වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවැත එන ණය ශේෂයේ එකතුව රු.403,261 ක් විය.

(ආ) එකතුව රු. 57,058,489 ක් වූ ටෙන්ඩර් තැන්පතු, රැඳවුම් මුදල් හා ලංසු සුරක්ෂණ ශේෂ 263 ක් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. එම ශේෂයෙහි රු.7,969,999 ක් වූ ණය ශේෂ 173 ක්, වසර 5 කට වඩා පැරණි වූ අතර, රු.49,088,490 ක් වූ ශේෂ 90 ක් වසර 1 හා වසර 4 ක් අතර කාල පරාසයක පැවතුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතිරීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු.123,692,743 ක පරිගණක සම්බන්ධයෙන් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 10 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) 2012 පෙබරවාරි 16 දිනැති අංක 156 දරන අයවැය චක්‍රලේඛයේ 06 වන ඡේදය සහ 2012 මාර්තු 26 දිනැති අංක 03/2012 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව අනවශ්‍ය විවිධ වියදම් කපා හැරිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දිනපොත් මුද්‍රණය ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී සියයට 185 කින් වර්ධනය වී තිබුණු අතර, මේ නිසා රු. 323,062 ක් වැඩිපුර වැය කිරීමට සිදු වී තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතුවල ඌනතාවය රු.214,560,331 ක් ද, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.96,632,029 ක් වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.117,928,302 කින් පිරිහී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රජයේ දායකය රු. 71,778,445 කින් සහ අනෙකුත් ආදායම රු.9,673,408 කින් වැඩි වුවත්, ගිවිසුම් ගත සේවා, අනෙකුත් පුනරාවර්ථන වියදම්, සැපයුම් හා පාරිභෝජන සහ නඩත්තු වියදම් සඳහා ඉකුත් වර්ෂයට වඩා රු.60,640,848 කින් වැඩි වී තිබීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය තුළ ශිෂ්‍යයින් 3359 දෙනෙකුගේ අධ්‍යාපනය වෙනුවෙන් දරන ලද පිරිවැය රු. 724,914,540 ක් වු අතර, ඒක ශිෂ්‍ය පිරිවැය රු. 215,813 ක් විය. ඉකුත් වර්ෂයේ ශිෂ්‍යයින් 3167 දෙනෙකුගේ අධ්‍යයන පිරිවැය රු.575,946,435 ක් වූ අතර, ඒක ශිෂ්‍ය පිරිවැය රු.181,859ක් විය. ඒ අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.33,954 කින් වර්ධනය වී තිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

වටිනාකම රු.82,453,399 ක් වූ ඉඩම් විශ්වවිද්‍යාලයේ පාලනය යටතේ පැවතිය ද, නීත්‍යානුකූලව එහි අයිතිය පවරා ගැනිමට කටයුතු කර නොතිබුණි.

### 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් රු. 6,000,000 කට මිල දී ගත් මෝටර් රථයක් ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ ද, මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ සහතිකය අනුව එහි අයිතිය බාහිර පුද්ගලයෙකු සතු විය. එමෙන්ම, එය මිල දී ගැනීමට දිනකට ප්‍රථම ලියාපදිංචි කර තිබුණු බව සැපයුම්කරුගේ ලදුපත අනුව තහවුරු විය.

(ආ) විශ්වවිද්‍යාලයට පැවරීමට යෝජිතව තිබූ රු.119,284,110 වටිනා ඉඩම් හා ගොඩනැගිලි විශ්වවිද්‍යාලය සතු වත්කම් ලෙස ගිණුම්ගතකර තිබූ නමුත් පසු කාලීනව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත පවරාගෙන තිබුණි.

**4.4 නිෂ්ක්‍රිය ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ග අඩි 7,926 ක වපසරියක් සහිත ගොඩනැගිලි 06 ක් 2012 වර්ෂයේ සිට 2014 ජුනි මාසය දක්වාම නිෂ්ක්‍රියව පැවැතුණි.

(ආ) වටිනාකම රු. 388,164 ක් වූ යන්ත්‍රෝපකරණය 2011 වර්ෂයේ සිට 2014 ජූනි මාසය දක්වාම නිෂ්ක්‍රියව පැවැතුණි.

**4.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා පිටියට යාබදව ඇති මාර්ගයේ වර්ග අඩි 1751 ක පදික වේදිකාවක් සැකසීම සඳහා රු. 376,256 ක් ගෙවා තිබුණු අතර, ඊට අදාළව පහත කරුණු අනාවරණය විය.

(i) අන්තර් සම්බන්ධතා ගල් (Interlocking Pavement Blocks) නිසි පරිදි ඇතිරීමට පියවර නොගැනීම නිසා රු. 83,612 ක පිරිවැයක් සහිත වර්ග අඩි 400 කට ආසන්න ප්‍රමාණයක් ගිලා බැස තිබුණු අතර, පදික වේදිකාවේ උරහිස්වලට (Shoulders) යොදා තිබුණු කළුගල් කුඩු හා වැලි මිශ්‍රිත සිමෙන්ති, අන්තර් සම්බන්ධතා ගල් සමඟ මනාව සම්බන්ධ නොවීම නිසා එම උරහිස් ගල්වලින් වෙන්ව ඉවතට තල්ලු වී ගොස් තිබුණි.

(ii) මිල ගණන් කැඳවීමට පෙර හා වැඩ ඉංජිනේරු විසින් සකස් කළ ප්‍රමාණ පත්‍රය අනුමත කළ දිනයට දින 03 කට පෙර එක් කොන්ත්‍රාත්කරුවෙකු විසින් මිල කියුම් ඉදිරිපත් කර තිබුණි.

(ආ) ඇස්තමේන්තුගත පිරිවැය රු. 3,882,094 ක් වූ ක්‍රීඩා පිටිය අසල කාපට් මාර්ගයේ ආරක්ෂාව උදෙසා වූ පැති බැම්ම ඉදිකිරීම වෙනුවෙන් රු. 3,253,182 ක් ගෙවා තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි විය.

(i) පස් භාවිතයට ගැනීමට පෙර මුට්ට කර මිණුම් ගෙන නොතිබීම නිසා පස් ඝන මීටර් 852.08 ක් සඳහා ගෙවූ රු.1,108,640 ක මුදලෙහි නිවැරදිතාව ගැටළු සහගත විය. එමෙන්ම, ප්‍රමිතියකින් අඩු පස් යොදා ගෙන ඝන පස් ස්ථර ඇති වන ආකාරයට තලා නොතිබුණු බව වැඩ ඉංජිනේරු විසින් සනාථ කර තිබීමත් නිසා වැය කළ එම මුදල අනාර්ථික ගනුදෙනුවක් විය.

(ii) බැම්ම ඉංජිනේරු සැලැස්මට අනුව නිසි ප්‍රමිතියකින් යුතුව ඉදි නොකිරීම හා ඉදි කිරීම්වල පවතින අඩුපාඩු නිසා රු. මිලියන 18.01 ක් වැය කරමින් ඉදි කළ කාපට් මාර්ගයට එය අහිතකර ලෙස බලපා තිබුණි.

**4.6 ඉටු නොකළ ව්‍යාපෘති**

අමාත්‍ය මණ්ඩලය විසින් 2005 හා 2007 වර්ෂවල දී පිළිවෙලින් තොරතුරු තාක්ෂණ ගොඩනැගිල්ලක් හා පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවත්, 2014 අගෝස්තු මාසය දක්වාම එම ගොඩනැගිලි කිසිවක් ඉදිකිරීම ආරම්භ කර නොතිබුණ ද, උපදේශන සේවා සඳහා රු.3,314,508 ක් වියදම් කර තිබුණි.

**4.7 ආර්ථික නොවූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය තුළ දත්ත සමුදායක් (Data base) නිර්මාණය කොට ස්ථාපනය කිරීමට කාර්ය පැවරුමක් 2012 මැයි සිට මාස 06 කට නිලධාරිනියකට ලබා දී තිබුණ ද, එම කාර්ය ඉටුකර නොතිබීම හේතුවෙන් ඒ වෙනුවෙන් ගෙවූ රු. 150,000 ක් නිෂ්ඵල වියදමක් විය.

(ආ) විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරයෙකු වෙත මාසිකව රු.45,000 ක දීමනාවක් හා ඊට අතිරේකව රු. 400 ක මාසික කුලියකට නිවසක්ද ලබාදී බාහිර අංශයේ සහකාර ලේඛකාධිකාරී තනතුරේ කටයුතු ඉටුකිරීම සඳහා කාර්ය පැවරුම් පදනම මත පත්වීමක් ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මාසයේ සිට මෙම පත්කිරීම සිදු කර තිබුණද, සැප්තැම්බර් මාසයේ වැඩ බාර ගැනීම කර තිබු බැවින්, රාජකාරිය නිරත නොවී දින 58 ක් සඳහා ගෙවූ වැටුප දළ වශයෙන් රු.87,000 ක මුදල අනාර්ථික වී තිබුණි.

**4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 මැයි 28 දිනට තනතුරුවල පුරප්පාඩු 102 ක් පැවැති අතර, ඒ තුළ මූල්‍යාධිකාරී, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී සහ පීඨ 02 ක මහාචාර්ය තනතුරු 03 ක පැවති පුරප්පාඩු සම්පූර්ණ කිරීමට 2012 ඔක්තෝබර් 10 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියෝග ලබා දී තිබුණද, තනතුරුවල පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට පියවර ගෙන නොතිබුණි.

(අ) 2012 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින, මූලික වැටුප රු. 26,020 ක් වූ සහකාර ලේඛකාධිකාරී (නීති හා ප්‍රලේඛණ) තනතුරට නිත්‍ය පත්කිරීමක් සිදු නොකර කාර්ය පැවරුම් පදනම මත එම කටයුතු ඉටු කිරීමට මසකට රු. 70,000 බැගින් ගෙවා නිලධාරියෙකු පත් කර එම දීමනාවට අතිරේකව දුරකථන හා නේවාසික පහසුකම් අයකිරීමකින් තොරව සපයා දීමට පාලක සභාව තීරණය කර තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය පරිදි පූර්ව තෙවර්ෂයෙහි මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාල සීමාවට සකස් කළ සංයුක්ත සැලැසුමෙහි අන්තර්ගතව නොතිබුණි. එමෙන්ම, ඉටුකර ගත යුතු

ඉලක්කයන්හි මූල්‍යමය අගයන් දක්වා නොතිබුණු බැවින් වාර්ෂික ප්‍රගතිය ඇගැයීමට හැකි ආකාරයෙන් සංයුක්ත සැලැස්ම සකස් කර නොතිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

ක්‍රියාකාරී සැලැසුමක් වාර්ෂිකව සකස් කර නොතිබුණු අතර, 2011-2015 දක්වා වර්ෂ 05ක් වෙනුවෙන් සකස් කළ ක්‍රියාකාරී සැලැසුමක්, සංයුක්ත සැලැසුමේ ඇතුළත් කර තිබුණි.

### 5.3 විගණන හා කළමනාකරණ කමිටු

2010 දෙසැම්බර් 14 දිනැති අංක 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන් මාස තුනකට වරක් විගණන කමිටු රැස්විය යුතු බව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂයේ දී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි.

### 5.4 අයවැය ලේඛනමය පාලනය

අයහාර වියදම් වෙනුවෙන් ඇස්තමේන්තු කළ සීමාවන් ඉක්මවා රු.මිලියන 24 ක් වැයකර තිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 130 ක් විය. එමෙන්ම, ප්‍රාග්ධන වියදම් ලෙස අයවැය ලේඛණය මඟින් සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 30 ක් හෙවත් රු. මිලියන 121 ක් ඉතිරි වී තිබුණු අතර, වියදම් විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන ඉක්මවා රු. මිලියන 96 ක් වැය කර තිබුණි. ඒ අනුව ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස අයවැය ලේඛණය යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

### 5.5 නොවිසඳී ඇති විගණන ඡේද

2012 ඔක්තෝබර් 10 සහ නොවැම්බර් 06 දිනයන්හි පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දී තිබෙන නියෝග ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පහත පරිදි විය.

(අ) සේවයෙන් පහකරන ලද සේවකයෙකුට එරෙහිව නගන ලද චෝදනා සනාථ කිරීමට හා කම්කරු සේවිකාවක් වෙනුවෙන් විනයානුකූල කටයුතු නිසි පරිදි ඉටු කිරීමට හිටපු ලේඛකාධිකාරී අපොහොසත් වීම හේතුවෙන් රු. 941,836 ක් වන්දි ලෙස ගෙවීමට සිදු වීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් නිශ්චය කර නොතිබුණි.

(ආ) වෘත්තීය සමිති රැස්වීමකට සහභාගී වීමට ලබාගත් බස් රථ වෙනුවෙන් රු. 139,000 ක ගාස්තු විශ්වවිද්‍යාලයේ සේවකයින්ගේ පුද්ගලික නම්වලට ගෙවා තිබීම වංචාවක් බැවින් ඊට අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) යෝජිත තොරතුරු තාක්ෂණ ගොඩනැගිල්ලේ උපදේශන සේවා සඳහා කළ රු. 1,321,189 ක ගෙවීම මතභේදයක් නිසා බේරුම් කිරීමකට යොමු කර ඇති අතර බේරුම් කිරීම අවසන්ව නොමැති බැවින් ගොඩනැගිල්ල ඉදි කිරීම පසුවට කල් දමා තිබුණි.

(ඈ) වැටුප් රහිත නිවාඩු මත විදේශගතව පසුව සේවයෙන් ඉවත් වී තිබුණු නිලධාරියගෙන් අය විය යුතු වූ රු.1,993,082 ක සේවක ණය ශේෂය අයකර ගැනිම සඳහා නීතිමය පියවර ගෙන නොතිබුණි.

(ඉ) පණිහාරත එළිමහන් රංග පීඨය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ආරක්ෂක ඇපකරයක් රහිතව පවරා දී පසුව විශ්වවිද්‍යාලය විසින් එම ගිවිසුම අවලංගු කර තිබීම නිසා කොන්ත්‍රාත්කරුගෙන් අය විය යුතු රු. 1,008,816 ක මුදල කොන්ත්‍රාත්කරුට ගෙවීමට ඇති මුදල්වලින් අය කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

**06. පද්ධති හා පාලන**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා විගණන විමසුම් මගින් වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) සේවක කළමනාකරණය
(ඈ) සංයුක්ත හා ක්‍රියාකාරී සැලැසුම්